සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

5819

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

24 - 11 - 2016

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

නම :- ........................ විභාග අංකය :- ............

සැලකිය යුතුයි:

- I හා II යන කොටස්වලින් මෙම පත්‍රය සමන්විතය.
- I කොටසේ සියළුම ප්‍රශ්නවලට හා I කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න. I, II පිළිතුරුපත් එකට ගැටගසා භාරදෙන්න.
- I, II ප්‍රශ්න පත්‍ර සඳහා මුළු ලකුණු 50ක් වන අතර, ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50ක් වශයෙන් මුළු ලකුණු 100කි.

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට අදාල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) නාට්‍යයක් සාර්ථක කර ගැනීම සඳහා යොදා ගන්නා කලාවන් හැඳින්වෙන්නේ,
(i) ආනුෂංගික කලා (ii) ලලිත කලා
(iii) ගැමි කලා (iv) දෘෂ්‍ය කලා

(02) පසුතල නිර්මාණ වේදිකාව මත ප්‍රතිනිර්මාණය කරනු ලබන්නේ,
(i) ලෝකධර්මී නාට්‍යවලය (ii) නාට්‍යධර්මී නාට්‍යවලය
(iii) මිශ්‍ර ශෛලියට අයත් නාට්‍යවලය (iv) අභූතරූපී නාට්‍යවලය

(03) සාර්ථක නාට්‍යයක් බිහි කිරීමෙහිලා ප්‍රධාන වගකීම දරනු ලබන්නේ,
(i) පෙළ මතක් කරන්නාය (ii) වේදිකා පාලකයා
(iii) මුදල් වැය කරන්නාය (iv) අධ්‍යක්ෂවරයාය

(04) ස්වභාවිකත්වයට අනුරූපව පෙන්විය නොහැකි දෑ අතිශයොක්තියෙන් මෙන්ම වඩා සෞන්දර්යාත්මකව ඉදිරිපත් කිරීම සිදුවන්නේ,
(i) නාට්‍යධර්මී නාට්‍යවලය (ii) ලෝකධර්මී නාට්‍යවලය
(iii) මිශ්‍ර ශෛලියේ නාට්‍යවලය (iv) ස්වභාවික නාට්‍යවලය

(05) පුත්‍ර සමාගම, තලමල පිපිලා, ගුරුතරුව යන නාට්‍ය නිෂ්පාදනය කලේ,
(i) සුගතපාලද සිල්වා මහතාය (ii) ජයලත් මනෝරත්න මහතාය
(iii) හෙන්රි ජයසේන මහතාය (iv) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාය

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.
(පරිකල්පනය , සාමූහික, රාවනේෂන්, පසුතල, අර්ථපති)

(06) චිත්‍ර වස්ත්‍ර මගින් ද ........................ නිර්මාණය කරයි.

(07) නාට්‍ය යනු ...................................................... කලාවකි.

(08) අප අසන දකින සිද්ධි වේදිකාව මත ප්‍රතිනිර්මාණය කිරීමට ........................................................ ශක්තිය භාවිතා කල හැක.

(09) නාට්‍ය සඳහා මුදල් වැය කරන්නා ...................................................... නම් වේ.

(10) ................................... නාට්‍ය නිෂ්පාදනය කරනු ලබන්නේ මහාචාර්ය එස්. විද්‍යානන්දන් මහතා විසිනි.

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණත්, වැරදි නම් (×) ලකුණත් යොදන්න.

(11) ජෙරොම් ලක්ෂමන් ද සිල්වා කුත්තු සම්ප්‍රදාය නවීකරණය කලේය. (   )

(12) රූපණයේ දී අ අක්ෂි සම්බන්ධතාවය රැක ගැනීමට දර්පණ අභ්‍යාසවල නිරතවීම ඉතා වැදගත් වේ. (   )

(13) නළුවෙකුගේ ප්‍රධාන ප්‍රකාශන මාධ්‍ය ශරීරය වේ. (   )

(14) පරිසරයෙන් ලබාගන්නා අමුද්‍රව්‍යවලින් සරල ආදේශක භාණ්ඩ සකස් කරගත හැක. (   )

(15) 'මහගිරි දඹ' දයානන්ද ගුණවර්ධනයන්ගේ නාට්‍ය නිර්මාණයකි. (   )

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාල පිළිතුරු අංකය වරහන තුළ යොදන්න.


A


B


C


D

(16) A ඡායාරූපයෙන් දැක්වෙන්නේ,
(1) බෙර හඬ නාට්‍යයේ අධ්‍යක්ෂවරයා ය
(2) හුණුවටයේ කතාව නාට්‍යයේ අධ්‍යක්ෂවරයා ය
(3) කැළණි පාලම නාට්‍යයේ අධ්‍යක්ෂවරයා ය
(4) සුභ සහ යස නාට්‍යයේ අධ්‍යක්ෂවරයා ය

(17) ඉහත A ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුවාගේ යැයි ඔබ හඳුනාගත් නාට්‍යය
(1) චැපෙක් සහෝදරයන්ගේ 'කෘමි' නාට්‍යයේ අනුවර්තනයකි
(2) 'ජුලියස් හේ' ගේ 'ද හෝස්' නාට්‍යයේ පරිවර්තනයකි
(3) 'බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්'ගේ ද කොකේසියන් චෝක් සර්කල් නාට්‍යයේ පරිවර්තනයකි
(4) ශාර්ෂියා ලෝකාගේ යේර්මා නාට්‍යයේ අනුවර්තනයකි

(18) ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කල නාට්‍යකරු දැක්වෙන්නේ කුමන ඡායාරූපයේ ද?
(1) A ඡායාරූපයේ ය (2) B ඡායාරූපයේ ය
(3) C ඡායාරූපයේ ය (4) D ඡායාරූපයේ ය

(19) C ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු,

(1) සොෆොක්ලීස්ගේ 'ඉක්නෙවුටා ඉ' සැටර් නාට්‍ය ඇසුරෙන් බෙර හඬ නාට්‍ය නිර්මාණය කරන ලදී.

(2) ජනකතා දෙකක් ඇසුරින් නරිබෑණා නාට්‍ය ඇසුරින් මුහුදු පුත්තු නාට්‍ය නිර්මාණය කරන ලදී.

(3) ශාර්ෂියා ලෝකාගේ යෙර්මා නාට්‍ය ඇසුරින් මුහුදු පුත්තු නාට්‍ය නිර්මාණය කරන ලදී.

(4) ස්වර්ණහංස ජාතකය ඇසුරින් බව කඩතුරාව නාට්‍ය නිර්මාණය කරන ලදී.

(20) වීදි නාට්‍ය කලාවේ පියා ලෙස සැලකෙන්නේ,

(1) A ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුවා වේ.

(2) B ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුවා වේ.

(3) C ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුවා වේ.

(4) D ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුවා වේ.

(ලකුණු 1 × 20 = 20)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) (i) කදාවළලු නාට්‍ය සඳහා මූලාශ්‍ර කොටගත් ජාතක කතාව කුමක්ද? (ලකුණු 02)

(ii) මෙම නාට්‍යයේ එන බෝසත් චරිතය හා දුෂ්ට චරිතය නම් කරන්න. (ලකුණු 02)

(iii) මෙම නාට්‍ය නිර්මාණය වී ඇති ශෛලිය කුමක් ද? (ලකුණු 02)

(iv) මෙම නාට්‍යයෙන් දැක්වෙන නාට්‍ය දෘෂ්ටිය කුමක් ද? (ලකුණු 02)

(v) කදා වළලු නාට්‍යය සාර්ථක වීමට බලපෑ ප්‍රධාන හේතුන් 2ක් ලියන්න. (ලකුණු 02)

(ලකුණු 2 × 5 = 10)

(02) (i) භූමිකාව යනු කුමක් ද? (ලකුණු 03)

(ii) ඔබ කැමති ඕනෑම චරිතයක් නම් කොට එහි දැකියහැකි භූමිකා 03ක් නිදසුන් දෙමින් පෙන්වා දෙන්න. (ලකුණු 03)

(iii) භූමිකා නිරූපණය සඳහා නළුවෙකුට උපකාරීවන රංග අභ්‍යාස 03ක් නම් කර කෙටියෙන් පහදන්න. (ලකුණු 04)

(03) (i) අංග රචනය සඳහා භාවිතා කරන ද්‍රව්‍ය 03ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) අංග රචනයේ දී මුහුණ බෙදන ප්‍රධාන කොටස් 06 නම් කරන්න. (ලකුණු 03)

(iii) මූලික වශයෙන් අංග රචනය බෙදෙන ප්‍රධාන කොටස් ගණන කීය ද? ඒවා කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

(04) (i) රංග අභ්‍යාසය යනු කුමක් ද? (ලකුණු 03)

(ii) රංග ක්‍රීඩාවල යෙදීමෙන් ලැබෙන ප්‍රයෝජන 03ක් ලියන්න. (ලකුණු 03)

(iii) පංති කාමරයේදී ඔබ උගත් රංග ක්‍රීඩාවක් සිදුකරන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 04)